


**මාතර, ශ්‍රී සුදර්ශී විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති**

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

**ගරු ස්වාමීන් වහන්ස, පින්වත්නි,**

**අපපමතෙතා උභො අතෙථ අධිගණහාති පණඩිතො**

**දිටෙඨ ධමෙම ච යො අතෙථා යොචතෙථා සමපරායිකො**

**අතථාභිසමයා ධීරො පණඩිතොති පවුචචතීති.**

**(සංයුක්ත නිකායේ කෝසල සංයුතතයේ කල්‍යාණ මිතත සූත්‍රය)**

**"අප්‍රමාදීව කටයුතු කරන කල්‍යාණ මිත්‍ර පඬිවරයා දෙලොවම දියුණුව සලසා ගනී. උභයාර්ථයම සලසා ගන්නා හෙතෙම පණ්ඩිතයෙකු ලෙස සලකනු ලබයි."**

**අද නවම් පුර පසළොස්වක පොහොය දිනයකි. තථාගතයන් වහන්සේ සැරියුත් මුගලන් දෙනමට අගසව් තනතුරු පිරිනැමීම, භික්‍ෂූන් වහන්සේලාට ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීම, පිරිනිවන් පෑම සඳහා ආයු සංස්කාරය අත හැරීම යන කරුණු සිදුවූයේ අද වැනි පුර පසළොස්වක පොහොය දිනයකය. එවන් දිනයක මෙම සදහම් පණිවිඩයෙන් අපේක්‍ෂා කරන්නේ කල්‍යාණ මිත්‍ර පඬිවරයෙකු වී දෙලොව ජයගන්නා ආකාරය පැහැදිලි කර දීමටය.**

**මෙහිදී අප මූලාශ්‍රය කර ගන්නේ සංයුක්ත නිකායේ කෝසල සංයුක්තයේ සඳහන් කල්‍යාණ මිතත සූත්‍රයයි. පසේනදී කොසොල් රජතුමා තම රාජකාරී කටයුතු වලින් නිදහස් වී විවේකීව හුදලකාව සිටින විට මෙබඳු අදහස් ඇතිවිය. බුදුරජාණන් වහන්සේ ධර්මය මැනවින් දේශනා කොට ඇත. එම ධර්මය කළණ මිතුරන්, කළණ යහළුවන්, කළණයින් කෙරෙහි අවනතව ක්‍රියාකරන අයටය. පවිටු මිතුරන්, පවිටු යහළුවන්, පවිටු අය කෙරෙහි නැමුණු අයට නොවේ. රජතුමා තමා තුළ පැවති මේ අදහස බුදුන් වහන්සේට දැන්වීය.**

බුදුරජාණන් වහන්සේ රජතුමාගේ අදහස ඉතා සතුටින් අනුමත කළ සේක. එසේ අනුමත කරමින් එම අදහස තවදුරටත් සනාථ කිරීම සඳහා පැරණි සිද්ධියක් මතක් කර දුන්හ. මහරජතුමනි, මම එක් කාලයක ශාක්‍ය ජනපදයේ නාගරක නම් නියම් ගමේ වාසය කළෙමි. එතනට පැමිණි ආනන්ද හිමියන් මට ප්‍රකාශ කළේ මේ ශාසනයෙන් හරි අඩක්ම කල්‍යාණ මිත්‍රතාවය මත පවත්නා බවයි. "උපඩ්ඪමිදං භනෙත බ්‍රහමචරියසස යදිදං කල්‍යාණ මිතතතා කල්‍යාණ සහායක කල්‍යාණ සමපවඩකතාති" එවිට මම අනඳ හිමියන්ට දේශනා කළේ "එහෙම කියන්න එපා ආනන්ද මේ මුළු බුදු සසුනම පිහිටා ඇත්තේ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය මත බවයි." "මා හෙවං ආනනද මා හෙවං ආනඤ සකල මෙව හිදං බ්‍රහ්ම චරියං යදිදං කල්‍යාණ මිතතතා, කල්‍යාණ සහායකා, කල්‍යාණ සමපවඩකතාති"

බුදුරජාණන් වහන්සේ හා කොසොල් රජතුමා අතර පැවති මෙම සාකච්ඡාව නූතනයේ ජීවත් වන ගිහි පැවිදි අප හැමදෙනාටම දෙලොව ජයගත හැකි අදහසකි. පාප මිත්‍රයින් සිටියොත් ඔවුන් නිසා රජතුමාගේ කීර්තිය කළුවර පක්ෂයේ සඳමෙන් අඩුවී යන බව කොසොල් රජතුමාට වැටහෙන්නට ඇත. කල්‍යාණ මිත්‍රයින් ඇසුරු කළොත් පුර පක්ෂයේ සඳ මෙන් තම කීර්තිය වැඩිවන බවත් ඒ තුළින් දෙලොව ජයගත හැකි බව රජතුමා වටහා ගන්නට ඇත. ඒ නිසා බුදුන් වහන්සේ තමා සමීපයේ ජීවත් වූ කොසොල් රජුට කල්‍යාණ මිත්‍ර සම්පත්තියේ වටිනාකම හඳුන්වාදීම සඳහා මෙම සූත්‍රය උපයෝගී කරගත් බව පෙනේ.

කල්‍යාණ මිත්‍රයා කවුද යන්න ගැන ඉතා පැහැදිලි විස්තරයක් මේ සූත්‍රයේ සඳහන් වේ. යමෙක් ආර්ය අෂ්ටාංගික මාර්ගය භාවිතා කරයිද, බොහෝ කොට භාවිතා කරයිද, ඔහු කායික මානසික විවේකයෙන් යුක්තව ජීවත් වේ. (විවේක නිසසිතං) ඔහු රාගය නැති කිරීමේ පැත්තට යොමුවේ (විරාග නිසසිතං) නිවන පිණිස යොමුවේ. (නිරොධ නිසසිතං) අල්ලා ගැනීමෙන් තොරව අත්හැරීමේ සිතින් යුක්තව වාසය කරයි. (වොසසගග පරිණාමිං) ඉහත සඳහන් කළ සංකල්ප හතර බුදුදහමට ආවේණික වූ බුදුදහමේ අනන්‍යතාවය තහවුරු කරන කරුණු හතරකි. බුදු දහම උගන්වන කල්‍යාණ මිත්‍ර පඬිවරයා ඉහත කී කරුණු හතර සම්බන්ධ කරගෙන අරිඅටගි මගෙහි ගමන් කරයි. එසේ ගමන් කරන ඔහු තම දෙලොවම ජයගනී.

ආර්ය මාර්ගයේ පළමුවන අංගය වන සම්මා දිට්ඨිය යනු නිවැරදි යහපත් දැක්මයි. හරිදේ හරි ලෙසත් වැරදි දේ වැරදි ලෙසත් දැනගැනීම සම්මා දිට්ඨි නම්වේ. චතුරාර්ය සත්‍ය නම් වූ හරි දැක්ම සම්මා දිට්ඨිය නම්. දීඝ නිකායේ බ්‍රහ්ම ජාල සූත්‍රයේදී 62 ක් දෘෂ්ටිවාද ඉවත ලූ බුදුන් වහන්සේ තම අනුගාමිකයන් 63 වන දෘෂ්ටියකට යොමු නොකල බව පෙනේ. අප බොහෝදෙනෙකුට කටපාඩම්ව තිබෙන කරණීය මෙතත සූත්‍රයේදී දේශනා කරන්නේ සිල්වත් පුද්ගලයා දෘෂ්ටි වලට නොපැමිණ දර්ශනයෙන් යුක්තව කටයුතු කොට නැවත නූපදින තත්වයට පත්වන බවයි. ඒ තුළ දැකිය හැක්කේ විවේකය, විරාගය, නිරෝධය සහ අත්හැරීමයි. කල්‍යාණ මිත්‍රයා මෙම සම්මා දිට්ඨියෙහි පිහිටා දෙලොවම ජයගනී. (සම්මා දිට්ඨි)

ආර්ය මාර්ගයේ දෙවන අංගය වන සම්මා සංකල්පය යනු නිවැරදි යහපත් කල්පනාවෝය. පංචකාම සම්පත්තියෙන් ඈත්විය යුතුයි. (නෙක්ඛම්ම) ව්‍යාපාදය හෙවත් තරහව නැතිකර ගත යුතුයි. (අව්‍යාපාද) හිංසාව නැතිකර ගත යුතුයි. (අවිහිංසා) මේ යහපත් කල්පනා ඇති කල්‍යාණ මිත්‍රයා විවේකයෙන්, විරාගයෙන්, නිරෝධයෙන්, අත්හැරීමෙන්, යුක්තව කටයුතු කරමින් දෙලොව ජයගනී. (සම්මා සංකප්ප)

ආර්ය මාර්ගයෙහි තෙවන අංගය නිවැරදි යහපත් වචනයෝය. සන්නිවේදන සම්භාෂණ ක්‍රියාවලියේදී බොරුවෙන්, කේලමින්, පරුස වචනයෙන් හා හිස් වචන වලින් මිදිය යුතුයි. භාෂාවේ ගරුත්වය ආරක්ෂා කරන

පුද්ගලයා ඉතා හොඳ කල්‍යාණ මිත්‍රයෙකි. ඔහුගේ සියලු වචන චිත්ත විවේකය, විරාගය, නිරෝධය හා අත්හැරීම පිණිස හේතුවෙයි. එවන් පුද්ගලයා එම නිවැරදි වචන තුළින් දෙලොවම ජයගනී. (සම්මා වාචා)

ආර්ය මාර්ගයේ සතර වන අංගය සම්මා කම්මන්තයයි. ප්‍රාණඝාතයෙන් අදත්තා දානයෙන්, කාම මිත්‍යාචාරයෙන් වෙන්වීම මෙයින් අදහස් කෙරේ. ඉහත කී වැරදි චර්යාවෙන් මිදෙන කල්‍යාණ මිත්‍රයා මූලික මිනිස් අයිතිවාසිකම් තුනක් වූ ජීවන අයිතිය, දේපල අයිතිය, විවාහ ජීවිතයේ ගරුත්වය ආරක්ෂා කරදෙයි. මෙසේ තම කයින් සිදුවන වැරදි චර්යාවන්ගෙන් මිදෙන කල්‍යාණ මිත්‍ර පඬිවරයා ඒ තුළින් විවේකය, විරාගය, නිරෝධය, අත්හැරීම පුරුදු කොට දෙලොවම ජයගනී. (සම්මා කම්මන්ත)

ආර්ය මාර්ගයේ පස්වන අංගය සම්මා ආජීවයයි. ජීවත් වීම සඳහා මුදල් අවශ්‍යය. එම මුදල් හම්බකර ගැනීමේදී වැරදි ජීවනෝපාය වලින් ඈත්විය යුතුයි. දෑතේ මහන්සියෙන් දහඩිය වගුරුවා දැහැමි ලෙස ධනය හරි හම්බකරගත යුතුයි. කල්‍යාණ මිත්‍ර පඬිවරයා එසේ ධනය උපයන විට ඔහුගේ සිතට විවේකයක් දැනේ. ඔහු දැන් විරාගය, නිරෝධය, අත්හැරීම පෙරදැරි කරගෙන ජීවත් වී දෙලොවම ජයගනී. (සම්මා ආජීව)

ආර්ය මාර්ගයේ හය වන අංගය සම්මා වායාමයයි. මෙය කයේ වර්ධනය සඳහා කරන ව්‍යායාමයක් නොවේ. මනසේ වර්ධනය සඳහා කරන ව්‍යායාමයකි. තමාගේ ජීවිතය තුළ මෙතෙක් නූපන් අකුසලයක් වේ නම් එවැනි දේ ඇති නොවීම සඳහාත්, උපන් කුසලයක් වේ නම්, එවැනි දේ වැඩි වැඩියෙන් ඇතිකර ගැනීම සඳහා ගන්නා නිවැරදි උත්සාහය සම්මා වායාම නම්වේ. එවිට එම කල්‍යාණ මිත්‍ර පඬිවරයා මානසික විවේකයෙන් කටයුතු කරමින් විරාගය පිණිස, නිරෝධය පිණිස, සියලු බැඳීම් අත්හැරීම පිණිස කටයුතු කරයි. එම ක්‍රියාදාමය තුළින් ඔහු තම දෙලොවම ජයගනී. (සම්මා වායාම)

ආර්ය මාර්ගයේ හත්වන අංගය සම්මා සතියයි. නිවැරදි සිහිය මින් අදහස් කෙරේ. ගිහි පැවිදි හැමෝම නිතර සිහියේ තබාගත යුත්තේ අපි බෞද්ධයෝ වෙමු යන අදහසයි. අපේ සිහිය වෙනස් කරන්නට සමාජයෙන් විවිධ බලවේග ඉදිරිපත් වන්නට පුළුවන. එම සියළු බලවේග පරදවා තමා බෞද්ධයෙකු යන සිහිය ඉදිරියට ගත යුතුයි. බුදුරජාණන් වහන්සේ යනු අප සෑම දෙනාගේම පියාය. එම පියා දේශනා කළ සතර සතිපට්ඨානය නිතර සිහියේ තබාගෙන තම සියලු කාර්යයන් කළ යුතුයි. එසේ කටයුතු කරන කල්‍යාණ මිත්‍ර පඬිවරයා මානසික විවේකයෙන් කටයුතු කරයි. ඔහුගේ සිත විරාගය පිණිස නිරෝධය පිණිස යොමුවන අතර සියලු බැඳීම් අත්හැරීම පිණිස කටයුතු කරයි. එසේ ක්‍රියා කරන ඔහු දෙලොව ජයගනී. (සම්මා සති)

ආර්ය මාර්ගයේ අටවන අංගය සම්මා සමාධියයි. අපේ සිතේ ඇතිවන කෙලෙස් තිබෙනා තුරු සිත එක්තැන් කර ගැනීමට නොහැකිය. එසේ විසිරුණු සිත් ඇත්තාගේ දෙලොවම පරාජය වේ. සිත සමාධි ගත වූ විට ධ්‍යාන වැනි චිත්ත ශක්තීන් උපදවා ගත හැකිය. එවිට ඔහුගේ සිතට ඇතිවන්නේ විවේකයකි. එසේ විවේකීව ජීවත්වන පුද්ගලයා විරාගය, නිරෝධය, වෙත ලංවී සියළු බැඳීම් අත්හරී. දෙලොව දියුණුව වශයෙන් බුදුදහම කථාකරන නිවන යනු ඒ ශක්තියයි. (සම්මා සමාධි)

මේ කරුණු වලින් පැහැදිලි විය යුත්තේ කල්‍යාණ මිත්‍ර පඬිවරයා යනු අවංකව අව්‍යාජව ආර්ය මාර්ගයෙහි ගමන් කරන පුද්ගලයා බවයි. මෙහිදී බුදුන් වහන්සේ දේශනා කරන්නේ ආනන්ද හිමියනි, මෙලොව උපන් මිනිසුන් අතර මම ඉතාම ශ්‍රේෂ්ඨ කල්‍යාණ මිත්‍රයෙකු බවයි. ඊට හේතු දක්වන තැන, ඉපදීම ස්වභාවය කොට ඇති සත්වයින් ජාතිය නම්වූ ඉපදීමෙන් මුදවා ගනිමි. ජරාව හෙවත් වෙනස්වීම ස්වභාවය කොට ඇති සත්වයින් ජරාවෙන් මුදවා ගනිමි. ව්‍යාධිය හෙවත් ලෙඩවීම ස්වභාවය කොට ඇති සත්වයින් ව්‍යාධියෙන් මුදවා ගනිමි. මරණය ස්වභාවය කොට ඇති සත්වයින් මරණයෙන් මුදවා ගනිමි. සෝක පරිදේව දුක් දොම්නස් උපායාස

ස්වභාවය කොට ඇති සත්වයින් එයින් මුදවාගනිම්. තමාත් ඒ තත්වයට පත්වී අන් අයත් ඒ තත්වයට පත්කිරීමට කටයුතු කරන නිසා බුදුන්වහන්සේ යනු අප හැමදෙනාගේම කල්‍යාණ මිත්‍රයාණෝය. ඒ උතුම් කල්‍යාණ මිත්‍රයා දේශනා කල ධර්මය ස්වාක්ඛාතය. එම ධර්මයට අනුව යමින් ක්‍රියා කරන පුද්ගලයා කල්‍යාණ මිත්‍ර පණ්ඩිවරයෙකු බව මෙම සූත්‍රය පෙන්වා දෙන උතුම් පණිවිඩයයි. 2015 නව වසරට පා තැබූ අවස්ථාවේදී ගිහි පැවිදි අපි හැමෝම එබඳු කල්‍යාණ මිත්‍රයෙකු වී දෙලොව ජයගැනීමට උත්සාහ විය යුතුයි.

කොසොල් රටේ පාලකයා වූ පසේ නදී කොසොල් රජතුමාට එදා ඇතිවූ අදහස් නූතනයේ ජීවත් වන ගිහි පැවිදි අප හැම දෙනාටම ඇතිවන අදහසකි. බෞද්ධයා යනු සසර දික්කර ගෙන භවයෙන් භවයට ගමන් කරන අයෙකු නොවිය යුතුයි. හැකිතරම් ඉක්මනින් සසර කෙටිකරගෙන චිත්තවිවේකය ඇතිකරගෙන විරාගය පිණිස නිරෝධය පිණිස සියළු බැඳීම් වලින් ඈත්වීම පිණිස යොමුවිය යුතුයි. මේ චින්තනයට හරස් වන ප්‍රධානම බලවේගය අපේ සිත තුළ බලපවත්වන මමත්වයයි. ඒ මමත්වය නැතිකර ගත්දාට අපි කල්‍යාණ මිත්‍ර පණ්ඩිවරු වෙමු. ඒ තුළින් පමණි සසර ජයගත හැක්කේ.

මේ සඳහම් පණිවිඩය කියවන අපේ කුඩා දරුවනි. ඔබේ ඉහලම කල්‍යාණ මිත්‍ර පණ්ඩිවරයා අපේ බුදුරජාණන් වහන්සේය. එම බුදුරජාණන් වහන්සේ අප හැමදෙනාගේම පියාණන් වහන්සේය. එම පියා නොකල යුතුයයි යමක් දේශනා කොට ඇත්නම් ඒ කිසිවක් කරන්න එපා. අද පෝය දිනයේ අට සිල් සමාදන් වී කටයුතු කරන දරුවෙනි. වෙනදාට අපි පන්සල් සමාදන් වෙමු. එම වැරදි පහෙන් ඈත්ව කටයුතු කරමු. පන්සිල් රකින දරුවන්ට ඉතා හොඳින් ඉගෙන ගත හැකිය. ඊට හේතුව වැරදි නොකරන දරුවාගේ සිත විවේකයෙන් තබා ගැනීමයි. ඒ චිත්ත විවේකය තුළින් හොඳට ඉගෙන ගෙන සමාජයට වැඩදායක දරුවෙක් වීමට උත්සාහවත් විය යුතුයි. එහිදී තම ගෙදර තමාට සිටින හොඳම කල්‍යාණ මිත්‍රයින් විය යුත්තේ තම දෙමාපිය දෙපළයි. ඔවුන්ගේ සිත් අවිවේකී තත්වයට පත්නොකොට විවේකීව තබා ගැනීමට ඔබට කළ හැකි සියලු උදව් කළ යුතුයි. එහිදී තමාත් හොඳ කල්‍යාණ මිත්‍රයෙකු වී සමාජයේ ජීවත් වන සියලු දෙනා කල්‍යාණ මිත්‍රයින් කිරීමට උත්සාහ විය යුතුයි.

ගිහිගෙදර දහසක් කරදර මැද ජීවත් වන දෙමාපියනි, වැඩිහිටියනි, ඔබටත් එම මානසික විවේකය අවශ්‍යය. අද  බොහෝ දෙනා බුදුන් වහන්සේ අමතක කරමින් මහා චිත්ත පීඩා ඇතිව ජීවත් වෙති. වෙනත් පාපකාරී අමිත්‍රයන්ගේ වචන වලට හසුවී ක්‍රියාකරන ඔවුන්ට චිත්ත විවේකයක් නැත. ඔවුන් දෙලොවින්ම පරාජයට පත්වී සසර දිගුකර ගනී. ඒ තත්වයෙන් මිදීමට වැඩිහිටියන්ද උත්සාහ කළ යුතුයි.

සමාජයට උපදෙස් දෙන පැවිදි උතුමන් වහන්සේලාද මේ ගැන සිතිය යුතු කාලය උදාවී ඇත. අප කිසිදු සමාජමය බලවේගයකට හසුනොවී බුදුරජාණන් වහන්සේගේ දේශනාවට අනුව කටයුතු කොට අපේ දෙලොව ජයගත යුතුයි. ලැබූ මෙ නව වසරේ බෞද්ධයින් වන අපි සියළු දෙනා ඉහත කී පරිදි කල්‍යාණ මිත්‍ර පණ්ඩිවරයෙකු වී දෙලොව ජය ගැනීමට අධිෂ්ඨාන කර ගනිමු.